සියලු ම හිමිකම් ඇවිරිණි /முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2025
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2025
General Certificate of Education (Adv. Level) Examination, 2025

ආර්ථික විද්‍යාව I
பொருளியல் I
Economics I

21 S I

පැය දෙකයි
இரண்டு மணித்தியாலம்
Two hours

**උපදෙස්:**

* **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
* උත්තර පත්‍රයේ නියමිත ස්ථානයේ ඔබේ **විභාග අංකය** ලියන්න.
* උත්තර පත්‍රයේ පිටුපස දී ඇති උපදෙස් ද සැලකිල්ලෙන් කියවා පිළිපදින්න.
* **1** සිට **50** තෙක් එක් එක් ප්‍රශ්නයට (1), (2), (3), (4), (5) යන පිළිතුරුවලින් **නිවැරදි හෝ ඉතාමත් ගැළපෙන හෝ** පිළිතුර තෝරාගෙන, එය **උත්තර පත්‍රයේ පිටුපස දැක්වෙන උපදෙස් පරිදි කතිරයක්** (X) **යොදා දක්වන්න**.

**1.** සෑම සමාජයක ම කේන්ද්‍රීය ආර්ථික ගැටලුව ලෙස හිඟකම සැලකෙනුයේ
(1) එය විරැකියාව හා උද්ධමනය වැඩි කිරීමට හේතුවන බැවිනි.
(2) අසීමිත මිනිස් වුවමනා සපුරාලීම සඳහා සමාජය සතු සම්පත් සීමිත බැවිනි.
(3) මෙම ගැටලුව විසඳීම සඳහා රජයේ මැදිහත්වීම අකාර්යක්ෂම වන බැවිනි.
(4) සමාජයේ අසීමිත මිනිස් වුවමනා සපුරාලීමට ප්‍රමාණවත් මට්ටමකට සාධක ඵලදායිතාව ඉහළ නැංවීමට තාක්ෂණයට නො හැකි බැවිනි.
(5) සියලු ම සම්පත් සමජාතීය වන නිසා සමාජ අවශ්‍යතා සපුරාලීමට නො හැකි වන බැවිනි.

**2.** අවශ්‍යතා සහ වුවමනා අතර මූලික වෙනස වඩාත් හොඳින් පැහැදිලි කෙරෙනුයේ පහත සඳහන් කවර ප්‍රකාශයෙන් ද?
(1) අවශ්‍යතා කාලයත් සමග වෙනස් වේ. නමුත් වුවමනා නො වෙනස් ව පවතී.
(2) අවශ්‍යතා අසීමිත ය. නමුත් වුවමනා සීමිත ය.
(3) අවශ්‍යතා සංස්කෘතික බලපෑම් වෙතින් පැනනගින අතර වුවමනා ජීව විද්‍යාත්මක වේ.
(4) අවශ්‍යතා සැමවිට ම නිෂ්පාදකයන් විසින් නිර්මාණය කරනු ලබයි. නමුත් වුවමනා පාරිභෝගිකයන් විසින් නිර්මාණය කරනු ලැබේ.
(5) අවශ්‍යතා ජීවිතයේ පැවැත්ම සඳහා අත්‍යවශ්‍ය වේ. නමුත් වුවමනා ජීවිතය පවත්වා ගැනීමෙන් ඔබ්බට ඇති ආශාවන් පිළිබිඹු කරයි.

comerce help official

**3.** පහත සඳහන් ඒවායින් ශ්‍රම ඵලදායිතාව තීරණය කරන සාධකයක් **නො වන්නේ** කුමක් ද?
(1) අධ්‍යාපනය සහ පුහුණුව
(2) සේවකයන්ගේ අභිප්‍රේරණය
(3) සේවා නියුක්ති අනුපාතිකය ඉහළ යාම
(4) උසස් තාක්ෂණය ලබා ගැනීමේ හැකියාව
(5) වැඩ කරන වේලාවන් දීර්ඝ කිරීම

**4.** ආර්ථිකය දිගට ම එකම නිෂ්පාදන ලක්ෂ්‍යයක රැඳී සිටිමින් නිෂ්පාදනයෙහි යෙදී සිටින අතරතුර, නිෂ්පාදන හැකියා වක්‍රයෙහි පිටතට විතැන්වීමක් හඟවනුයේ
(1) සම්පත් බෙදා වෙන් කිරීමේ කාර්යක්ෂමතාව වැඩි දියුණු වී ඇති බව ය.
(2) නිෂ්පාදන කාර්යක්ෂමතාව වැඩි දියුණු වී ඇති බව ය.
(3) කාර්යක්ෂමතාවෙහි වැඩි දියුණුවීමකින් තොර ව ආර්ථික වෘද්ධිය හට ගෙන ඇති බව ය.
(4) ආවස්ථික පිරිවැය අඩු වී ඇති බව ය.
(5) ආර්ථිකය එහි ධාරිතාව ඉක්මවා නිෂ්පාදනයෙහි යෙදී සිටින බව ය.

**5.** සාමාන්‍ය භාණ්ඩයක් සඳහා වන ඉල්ලුම් වක්‍රය පහළට බෑවුම් වනුයේ
(1) ඉල්ලුම් කරනු ලබන ප්‍රමාණය ආදායම් හා ආදේශන ප්‍රතිවිපාක විසින් එක ම දිශාවට වෙනස් කරන බැවිනි.
(2) ආදායම වැඩි වීමත් සමග පාරිභෝගිකයා භාණ්ඩයේ පරිභෝජනය අඩු කරන බැවිනි.
(3) ආදායම් ප්‍රතිවිපාකය විසින් ආදේශන ප්‍රතිවිපාකය යටපත් කරනු ලබන බැවිනි.
(4) ආදේශන ප්‍රතිවිපාකය විසින් ආදායම් ප්‍රතිවිපාකය යටපත් කරනු ලබන බැවිනි.
(5) ආදායම් ප්‍රතිවිපාකය විසින් ආදේශන ප්‍රතිවිපාකයේ ප්‍රතිවිරුද්ධ දිශාවට ඉල්ලුම් ප්‍රමාණය වෙනස් කරනු ලබන බැවිනි.


[දෙවැනි පිටුව බලන්න

CamScanner

6. X භාණ්ඩයෙහි මිල අඩු වන විට X භාණ්ඩය සඳහා ඇති වෙළෙඳපොළෙහි බොහෝ දුරට සිදුවීමට ඉඩ ඇති ප්‍රතිඵලය වනුයේ
   (1) X භාණ්ඩයෙහි සැපයුම අඩු වීම ය.
   (2) X භාණ්ඩයෙහි ඉල්ලුම වැඩි වීම ය.
   (3) ඉල්ලුම අඩු වී සැපයුම වැඩි වීම ය.
   (4) X භාණ්ඩය ඉල්ලුම් කරනු ලබන ප්‍රමාණය වැඩි වීම ය.
   (5) X භාණ්ඩය සැපයුම් කරනු ලබන ප්‍රමාණය වැඩි වීම ය.

7. සැපයුම් නීතියෙන් ප්‍රකාශ වන්නේ
   (1) අනෙකුත් කරුණු නො වෙනස් ව තිබිය දී මිල ඉහළ යන විට සපයනු ලබන ප්‍රමාණය ඉහළ යන බව ය.
   (2) අනෙකුත් කරුණු නො වෙනස් ව තිබිය දී මිල පහළ යන විට සපයනු ලබන ප්‍රමාණය ඉහළ යන බව ය.
   (3) අනෙකුත් කරුණු නො වෙනස් ව තිබිය දී මිල ඉහළ යන විට සපයනු ලබන ප්‍රමාණය පහළ යන බව ය.
   (4) මිල ඉහළ යන විට සැපයුම් වක්‍රය දකුණට විතැන් වන බව ය.
   (5) මිල පහළ යන විට සැපයුම් වක්‍රය දකුණට විතැන් වන බව ය.

8. රූපසටහනෙහි දක්වා ඇති X සහ Y භාණ්ඩ දෙක සඳහා වන සමාන්තර ඉල්ලුම් වක්‍ර දෙක සම්බන්ධයෙන් වඩාත් නිවැරදි ප්‍රකාශය තෝරන්න.




   (1) X සහ Y වක්‍ර දෙක ම සෑම ශුන්‍ය නො වන මිලක දී ම ඒකීය මිල නම්‍යතාවකින් යුක්ත වේ.
   (2) X සහ Y වක්‍ර දෙක ම සෑම ශුන්‍ය නො වන මිලක දී ම සමාන නම්‍යතාවකින් යුක්ත වේ.
   (3) සෑම ශුන්‍ය නො වන මිලක දී ම Y වක්‍රයට වඩා ඉහළ මිල නම්‍යතාවක් X වක්‍රයට ඇත.
   (4) සෑම ශුන්‍ය නො වන මිලක දී ම X වක්‍රයට වඩා ඉහළ මිල නම්‍යතාවක් Y වක්‍රයට ඇත.
   (5) Y භාණ්ඩයට වඩා X භාණ්ඩයට ඇති ආදේශක ඉතා ස්වල්පයක් විය හැකි ය.

9. දෙහි සඳහා වෙළෙඳපොළ ඉල්ලුම් ශ්‍රිතය $Q_D = 150 - 2P$ සහ වෙළෙඳපොළ සැපයුම් ශ්‍රිතය $Q_S = -60 + 5P$ යැයි සිතමු. වෙළෙඳපොළ සමතුලිතයේ දී සමතුලිත ප්‍රමාණය සහ ආර්ථික අතිරික්තය කොපමණ ද?

| | සමතුලිත ප්‍රමාණය | ආර්ථික අතිරික්තය |
|---|---|---|
| (1) | 30 | 2 835 |
| (2) | 90 | 2 700 |
| (3) | 30 | 2 025 |
| (4) | 90 | 945 |
| (5) | 90 | 2 835 |

10. ආයතනයක් තම නිෂ්පාදනයේ මිල අඩු කළ පසුව, අලෙවි කළ ප්‍රමාණය ඒකක 100 සිට 130 දක්වා වැඩි වන නමුත් මුළු අයභාරය පහළ වැටෙන බව නිරීක්ෂණය කරයි. මින් හැඟවෙනුයේ මෙම තත්ත්වය යටතේ ඉල්ලුමේ මිල නම්‍යතාව ආසන්න වශයෙන්
   (1) −0.8ක් බව ය.   (2) −1.0ක් බව ය.   (3) −1.3ක් බව ය.
   (4) −1.5ක් බව ය.   (5) අපරිමිත බව ය.


11. භාණ්ඩයක් සඳහා වෙළෙඳපොළ ඉල්ලුම් ශ්‍රිතය $Q_D = 230 - 4P$ සහ වෙළෙඳපොළ සැපයුම් ශ්‍රිතය $Q_S = -70 + 6P$ යැ'යි උපකල්පනය කරන්න. ඒකකයක වෙළෙඳපොළ මිල රු. 50ක් වේ නම්, වෙළෙඳපොළ තුළ අසමතුලිතතාවක් ඇති වන අතර එහි ප්‍රතිඵලයක් ලෙස
   (1) ඒකක 30ක අතිරික්ත ඉල්ලුමක් හටගනී.   (2) ඒකක 120ක අතිරික්ත සැපයුමක් හටගනී.
   (3) ඒකක 200ක අතිරික්ත සැපයුමක් හටගනී.   (4) ඒකක 230ක අතිරික්ත ඉල්ලුමක් හටගනී.
   (5) ඒකක 230ක අතිරික්ත සැපයුමක් හටගනී.

[තුන්වැනි පිටුව බලන්න

commercehelp.official
අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාළ ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න
CamScanner

**12.** වෙළෙඳපොළ මිල කිලෝග්‍රෑමයකට රු. 100ක් සහ එහි විකුණුම් ප්‍රමාණය කිලෝග්‍රෑම් 1 500ක් වන කෘෂිකාර්මික බෝගයක් සඳහා ආරම්භක වෙළෙඳපොළ සමතුලිතතාවක් රූපසටහනෙහි දැක්වේ.

වෙළෙඳපොළ මිල කිලෝග්‍රෑමයකට රු. 125ක් දක්වා ඉහළ නැංවීමට රජය අදහස් කරන්නේ නම්, ඒ සඳහා රජයට කොපමණ මුදලක් වැය කිරීමට සිදුවේ ද?




(1) රු. 12 500
(2) රු. 62 500
(3) රු. 125 000
(4) රු. 150 000
(5) රු. 182 500

**13.** රජය සිසිල් බීම සඳහා 10% ක විශේෂිත බද්දක් පැනවූ බව උපකල්පනය කරන්න. එහි ප්‍රතිඵලයක් ලෙස ඉහළ ගිය සිසිල් බීම මිල විශාල වශයෙන් දරනු ලැබුවේ පාරිභෝගිකයන් විසින් මිස නිෂ්පාදකයන් විසින් නොවේ. මෙවැන්නක් සිදුවීමට බොහෝදුරට බලපෑ හැකි හේතුව කුමක් විය යුතු ද?

(1) ඉල්ලුමේ මිල නම්‍යතාව සැපයුමේ මිල නම්‍යතාවට වඩා වැඩි වීම ය.
(2) ඉල්ලුමේ මිල නම්‍යතාව සැපයුමේ මිල නම්‍යතාවට වඩා අඩු වීම ය.
(3) සැපයුමේ මිල නම්‍යතාව අනම්‍ය වී ඉල්ලුමේ මිල නම්‍යතාව නම්‍ය වීම ය.
(4) සැපයුමේ මිල නම්‍යතාව එකට වඩා අඩු වීම ය.
(5) ඉල්ලුමේ මිල නම්‍යතාව ඒකීය වීම ය.

**14.** රජය නිදහස් වෙළෙඳපොළ සමතුලිත මිලට වඩා ඉහළින් උපරිම මිලක් පනවනු ලැබුවහොත් පාරිභෝගික අතිරික්තයට සහ නිෂ්පාදක අතිරික්තයට ඇති වන බලපෑම කුමක් වන්නේ ද?

| | පාරිභෝගික අතිරික්තය | නිෂ්පාදක අතිරික්තය |
|---|---|---|
| (1) | පහළ වැටේ | ඉහළ නගී |
| (2) | ඉහළ නගී | පහළ වැටේ |
| (3) | පහළ වැටේ | අවිනිශ්චිත වේ |
| (4) | ඉහළ නගී | නො වෙනස් ව පවතී |
| (5) | නො වෙනස් ව පවතී | නො වෙනස් ව පවතී |

comerce help.official

**15.** කර්මාන්තයක විශාලත ම ආයතන හතර මුළු වෙළෙඳපොළ නිමැවුමෙන් 90% ක් නිෂ්පාදනය කරන්නේ නම්, එම වෙළෙඳපොළ

(1) ඒකාධිකාරී තරගයක් වේ.
(2) ශුද්ධ ඒකාධිකාරයක් වේ.
(3) පූර්ණ තරගය වේ.
(4) කතිපයාධිකාරයක් වේ.
(5) ස්වාභාවික ඒකාධිකාරයක් වේ.

**16.** කෙටි කාලයේ දී නිෂ්පාදනයෙහි යෙදී සිටින ආයතනයක විවිධ පිරිවැය වර්ග පිළිබඳ තොරතුරු කිහිපයක් පහත වගුවෙහි පෙන්නුම් කෙරේ.

| නිමැවුම (ඒකක) | මුළු විචල්‍ය පිරිවැය (රු.) | මුළු ස්ථාවර පිරිවැය (රු.) | මුළු පිරිවැය (රු.) | සාමාන්‍ය මුළු පිරිවැය (රු.) |
|---|---|---|---|---|
| 0 | 0 | 140 | | |
| 1 | | | 260 | |
| 2 | | | | 170 |

මෙම තොරතුරු පදනම් කර ගනිමින් දෙවැනි නිමැවුම් ඒකකය නිපදවන විට ආයතනයේ සාමාන්‍ය විචල්‍ය පිරිවැය සහ ආන්තික පිරිවැය අඩංගු වරණය තෝරන්න.

| | සාමාන්‍ය විචල්‍ය පිරිවැය (රු.) | ආන්තික පිරිවැය (රු.) |
|---|---|---|
| (1) | 80 | 100 |
| (2) | 100 | 80 |
| (3) | 100 | 120 |
| (4) | 120 | 80 |
| (5) | 130 | 100 |



CamScanner

17. පූර්ණ තරගකාරී කර්මාන්තයක සියලු ම ආයතන කෙටි කාලයේ දී ලාභය උපරිම කරමින් සිටින නමුත් තවදුරටත් පාඩු ලබන්නේ නම් ඉන් ගම්‍ය වන්නේ
(1) ආන්තික පිරිවැය ආන්තික අයභාරය ඉක්මවා යන බව ය.
(2) මිල ආන්තික පිරිවැයට සමාන නමුත් සාමාන්‍ය මුළු පිරිවැයට වඩා වැඩි බව ය.
(3) මිල ආන්තික පිරිවැයට සමාන නමුත් සාමාන්‍ය මුළු පිරිවැයට වඩා අඩු බව ය.
(4) මුළු පිරිවැය මුළු අයභාරයට සමාන බව ය.
(5) මුළු විචල්‍ය පිරිවැය මුළු අයභාරයට වඩා වැඩි බව ය.

18. පහත සඳහන් සාධක අතුරෙන් තම මුළු ඉපැයීම සංක්‍රාම ඉපැයීමකින් පමණක් සමන්විත වීමට වඩාත් ඉඩ ඇත්තේ කුමන සාධකයකට ද?
(1) කොළඹ නගරයේ ඉඩමක්
(2) ලෝක මට්ටමේ ක්‍රිකට් ක්‍රීඩකයෙක්
(3) සුවිශේෂී ඛනිජ නිධියක්
(4) පේටන්ට් බලපත්‍රලාභී නව නිපැයුමක්
(5) සාමාන්‍ය ලිපිකරු සේවකයෙක්

19. කිසියම් ආර්ථිකයක් සෘණ නිමැවුම් පරතරයක් ඇති කලාපයකට ඇතුළු වුවහොත්, ඉහළ යාමට බොහෝ දුරට ඉඩ ඇත්තේ පහත සඳහන් කවරක් ද?
(1) සමාහාර ඉල්ලුම
(2) විරැකියා අනුපාතිකය
(3) ව්‍යාපාර විශ්වාසය
(4) ආර්ථික වෘද්ධි අනුපාතිකය
(5) උද්ධමන අනුපාතිකය

20. ජාතික ආදායම් ගිණුම්කරණයේ දී නිෂ්පාදන ඉමෙන් බැහැර කරනු ලබන්නේ
(1) යැපුම් ගොවිතැන ය.
(2) හිමිකරු පදිංචි නිවාසවල ආරෝපිත බදු කුලිය ය.
(3) පුණ්‍යායතනයක් සඳහා ලබා දෙන ස්වේච්ඡා සේවා ය.
(4) නීති විරෝධී මත්ද්‍රව්‍ය නිෂ්පාදනය ය.
(5) රජය විසින් නොමිලයේ සපයනු ලබන සේවා ය.

21. ජාතික ආදායම් ගිණුම්කරණය තුළ මහ බැංකුව අයත් වන්නේ කුමන ආයතනික අංශයට ද?
(1) මූල්‍ය සමාගම්
(2) මූල්‍ය නො වන සමාගම්
(3) රාජ්‍ය අංශය
(4) ගෘහ ඒකක
(5) ලාභ අපේක්ෂාවෙන් තොර ව ගෘහ ඒකක සඳහා සේවා සපයන අංශය

22. නිෂ්පාදිත මත පැනවෙන බදු, නිෂ්පාදනය මත පැනවෙන වෙනත් බදුවලින් වඩාත් හොඳින් වෙන් කොට හඳුනාගත හැක්කේ පහත දැක්වෙන කවර ප්‍රකාශයකින් ද?
(1) නිෂ්පාදිත මත පැනවෙන බදු සැපයුම් පිරිවැය මත පදනම් වන අතර, නිෂ්පාදනය මත පැනවෙන වෙනත් බදු ලාභ මත පදනම් වේ.
(2) නිෂ්පාදිත මත පැනවෙන බදු භාණ්ඩ හා සේවාවල වටිනාකමට හෝ ප්‍රමාණයට සම්බන්ධ වන අතර, නිෂ්පාදනය මත පැනවෙන වෙනත් බදු ඉඩම් හා ගොඩනැගිලි වැනි නිෂ්පාදන සාධක සඳහා අදාළ වේ.
(3) නිෂ්පාදිත මත පැනවෙන බදු ආනයන හා අපනයන සඳහා පමණක් සම්බන්ධ වන අතර, නිෂ්පාදනය මත පැනවෙන වෙනත් බදු දේශීය නිෂ්පාදනයට පමණක් සම්බන්ධ වේ.
(4) නිෂ්පාදිත මත පැනවෙන බදු සැමවිට ම සෘජු බදු වන අතර නිෂ්පාදනය මත පැනවෙන වෙනත් බදු සැමවිට ම වක්‍ර බදු වේ.
(5) නිෂ්පාදිත මත පැනවෙන බදු මධ්‍යම රජය විසින් එකතු කරනු ලබන අතර, නිෂ්පාදනය මත පැනවෙන වෙනත් බදු පළාත් පාලන ආයතන විසින් එකතු කරනු ලැබේ.

23. සරල කේනිසියානු ආකෘතියෙහි සමාහාර වියදම් ශ්‍රිතයේ බෑවුම තීරණය කෙරෙනුයේ
(1) ආන්තික ඉතුරුම් නැඹියාව මගින් ය.
(2) සාමාන්‍ය ඉතුරුම් නැඹියාව මගින් ය.
(3) සාමාන්‍ය පරිභෝජන නැඹියාව මගින් ය.
(4) ආන්තික පරිභෝජන නැඹියාව මගින් ය.
(5) ස්වායත්ත පරිභෝජන මට්ටම මගින් ය.


24. රුපියල් මිලියන 100කින් සංක්‍රාම ගෙවීම් වැඩිවීමේ ප්‍රතිඵලයක් ලෙස, ජාතික ආදායම රුපියල් මිලියන 300කින් ඉහළ ගියහොත්, ආන්තික ඉතුරුම් නැඹියාවේ වටිනාකම කොපමණ ද?
(1) 0.25 (2) 0.4 (3) 0.75 (4) 0.8 (5) 0.85

[පස්වැනි පිටුව බලන්න

commerce help official
අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න
CamScanner

Past Papers Wiki

**25.** ආර්ථිකයක සමාහාර වියදම් සහ මූර්ත ජාතික ආදායම රූපසටහනෙහි පෙන්නුම් කෙරෙන අතර එම ආර්ථිකයෙහි විදේශ අංශයක් නොමැති බවත්, ආණ්ඩුවේ මිල දී ගැනීම් ආරම්භයේ දී ශූන්‍ය බවත් උපකල්පනය කෙරේ.




පූර්ණ සේවා නියුක්ති ජාතික ආදායම රු. මිලියන 800වෙත ළඟාවීම සඳහා අවශ්‍ය කරන ආණ්ඩුවේ මිල දී ගැනීම්වල අවම වැඩිවීම

(1) රු. මිලියන 100 කි.
(2) රු. මිලියන 160 කි.
(3) රු. මිලියන 200 කි.
(4) රු. මිලියන 500 කි.
(5) රු. මිලියන 800 කි.

**26.** මූලික උද්ධමනය වඩාත් හොඳින් විස්තර කෙරෙනුයේ

(1) දළ දේශීය නිෂ්පාදිතයේ අවධමනකය මගින් මනිනු ලබන උද්ධමනය ලෙසයි.
(2) සියලු ම පාරිභෝගික මිල සංරචක ඇතුළත් උද්ධමනය ලෙසයි.
(3) ආහාර හා බලශක්තිය වැනි නිතර වෙනස්වන සුළු අයිතම ඉවත් කළ උද්ධමනය ලෙසයි.
(4) විනිමය අනුපාතිකයේ වෙනස්වීම් සඳහා ගළපන ලද උද්ධමනය ලෙසයි.
(5) අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍යවල නිෂ්පාදක මිල ගණන් මගින් මනිනු ලබන උද්ධමනය ලෙසයි.

**27.** මහ බැංකුව විසින් කරනු ලබන විවෘත වෙළෙඳපොළ මිල දී ගැනීම් සාමාන්‍යයෙන්

(1) ආර්ථිකයේ පදනම් මුදල් අඩු කරයි.
(2) ණය දීමේ දී අය කෙරෙන පොලී අනුපාතික ඉහළ නැංවීමට වාණිජ බැංකු පොළඹවයි.
(3) තැන්පතු සංකෝචනය කිරීමෙන් උද්ධමනය අඩු කරයි.
(4) මුදල් වෙළෙඳපොළ ද්‍රවශීලතාව අඩු කරයි.
(5) වාණිජ බැංකුවල සංචිත සහ මුදල් මැවීමේ ධාරිතාව වැඩි කරයි.

comercehelp.official

**28.** ආර්ථිකයක මුදල් සඳහා ඇති ගනුදෙනු ඉල්ලුම වැඩි වීමට වඩාත් ම ඉඩ ඇත්තේ

(1) වෙළෙඳපොළ පොලී අනුපාතිකයේ ඉහළ යාමක් නිසා ය.
(2) දෛනික ගනුදෙනුවල දී ඩිජිටල් ගෙවීම් පද්ධති වැඩි වශයෙන් භාවිත කිරීම නිසා ය.
(3) ඉහළ පොලී අනුපාතික හේතුවෙන් බැඳුම්කර මිලෙහි පහත වැටීමක් නිසා ය.
(4) නාමික ජාතික ආදායමේ ඉහළ යාමක් නිසා ය.
(5) කොටස් වෙළෙඳපොළෙහි ඇති ඉහළ අවිනිශ්චිතතාව සහ අස්ථාවරත්වය නිසා ය.

**29.** අන්තර් බැංකු ඒක්ෂණ මුදල් අනුපාතිකය නියෝජනය කරනුයේ

(1) වාණිජ බැංකු අතර ණය දීමේ දී අය කරනු ලබන දිගු කාලීන පොලී අනුපාතිකය යි.
(2) ඇපකරයක් නොමැතිව වාණිජ බැංකු අතර එක් රැයකට අරමුදල් ණයට ගැනීම සඳහා අය කරනු ලබන කෙටි කාලීන පොලී අනුපාතිකය යි.
(3) මුදල් වෙළෙඳපොළෙහි නිකුත් කරනු ලබන කෙටි කාලීන භාණ්ඩාගාර බිල්පත් සඳහා රජය විසින් ගෙවනු ලබන පොලී අනුපාතිකය යි.
(4) වාණිජ බැංකු ඔවුන්ගේ ඉතුරුම් සහ ස්ථාවර තැන්පතු සඳහා තැන්පතුකරුවන්ට ලබා දෙන පොලී අනුපාතිකය යි.
(5) මහ බැංකුවේ නිත්‍ය ණය දීමේ හා නිත්‍ය තැන්පතු පහසුකම් ඔස්සේ පිළිබිඹු කෙරෙන ප්‍රතිපත්ති පොලී අනුපාතිකයන්ගේ සාමාන්‍ය අගය යි.

**30.** වාණිජ බැංකුවක අධි සංචිත රු. 10 000ක් වන බවත්, අවශ්‍ය සංචිත අනුපාතය 10%ක් බවත් සලකන්න. මෙම තත්ත්වය තුළ වාණිජ බැංකු පද්ධතියට අත්කර ගත හැකි මුළු විභව තැන්පතු ප්‍රසාරණය කොපමණ ද?

(1) රු. 9 000
(2) රු. 10 000
(3) රු. 90 000
(4) රු. 100 000
(5) රු. 120 000

[හයවැනි පිටුව බලන්න

CamScanner

**31.** පොදු භාණ්ඩයක් සුබසාධන භාණ්ඩයකින් වඩාත් හොඳින් වෙන් කොට හඳුනා ගත හැකි ප්‍රකාශය තෝරන්න.

(1) පොදු භාණ්ඩ සඳහා ගෙවීම් නො කරන්නන් බැහැර කළ හැකි වන අතර සුබසාධන භාණ්ඩ සම්බන්ධයෙන් එසේ කළ නො හැක.

(2) සුබසාධන භාණ්ඩ පෞද්ගලික අංශ විසින් පමණක් සපයනු ලබන අතර පොදු භාණ්ඩ පෞද්ගලික හා රාජ්‍ය යන දෙඅංශය විසින් ම සපයනු ලබයි.

(3) සුබසාධන භාණ්ඩ සෘණ බාහිරතා ජනනය කරන අතර පොදු භාණ්ඩ ධන බාහිරතා ජනනය කරයි.

(4) පොදු භාණ්ඩ පරිභෝජනයේ දී තරගකාරීත්වයක් සහ බැහැර කිරීමේ හැකියාවක් නොමැති අතර, සුබසාධන භාණ්ඩ පරිභෝජනයේ දී තරගකාරීත්වයක් සහ බැහැර කිරීමේ හැකියාවක් තිබිය හැකිය.

(5) සුබසාධන භාණ්ඩ ධන බාහිරතා ජනනය කරන අතර පොදු භාණ්ඩ සෘණ බාහිරතා ජනනය කරයි.

**32.** ආණ්ඩුව අසමත්වීමකට උදාහරණයක් වන්නේ මින් කුමන අවස්ථාවක් ද?

(1) පුනර්ජනනීය බලශක්තිය සඳහා ලබා දෙන සහනාධාරයක් කාබන් විමෝචනය අඩු කරන අතර, සුබසාධනය වැඩි දියුණු කරයි.

(2) අත්‍යවශ්‍ය භාණ්ඩ සඳහා මිල පාලනයන් භාණ්ඩ හිඟයන් සහ කළුකඩ බිහිකරයි.

(3) අනුක්‍රම බදුකරණය ආදායම් අසමානතාවය අඩු කරයි.

(4) රාජ්‍ය අංශය විසින් අධ්‍යාපනය සැපයීම ඉහළ සාක්ෂරතා අනුපාතවලට මගපාදයි.

(5) මූල්‍ය ප්‍රතිපත්තිය උද්ධමනය ඉලක්කගත මට්ටමක ස්ථාවර කරයි.

**33.** පහත සඳහන් දෑ අතුරෙන් රජයේ ප්‍රාථමික වියදමේ සංචරකයක් **නො වන්නේ** කුමක් ද?

(1) රාජ්‍ය අංශයේ සේවකයන්ගේ වැටුප්

(2) රාජ්‍ය ණය සඳහා පොලී ගෙවීම

(3) අධ්‍යාපනය සඳහා රජයේ වියදම්

(4) කුටුම්බ සඳහා ලබා දෙන වර්තන සංක්‍රාම සහ සහනාධාර

(5) යටිතල පහසුකම් සංවර්ධනය සඳහා ප්‍රාග්ධන වියදම්

**34.** හිඟ අය වැය මූල්‍යකරණයේ තෙරපුම් ප්‍රතිවිපාකය විස්තර කෙරෙනුයේ

(1) රජයේ වියදම් පෞද්ගලික පරිභෝජනය ඉහළ යාමට තුඩු දීමක් ලෙසයි.

(2) බදු කපාහැරීම පෞද්ගලික අංශයේ ණය ගැනීම් වැඩි කිරීමට හේතු වන බවයි.

(3) රජය අධික ලෙස ණය ගැනීම හේතුවෙන් පෞද්ගලික ආයෝජනය පහළ යාමක් ලෙසයි.

(4) පෞද්ගලික අංශයට බැඳුම්කර විකිණීම හරහා රජය වියදම් සඳහා මුදල් සපයා ගැනීමක් ලෙසයි.

(5) රජයේ ණය ගැනීම් හේතුවෙන් ඉහළ යන පොලී අනුපාතික උද්ධමනය වේගවත් කිරීමට හේතු වන බවයි.

**35.** ශ්‍රී ලංකාවේ විශාලතම විදේශ ණයහිමියන් කාණ්ඩය වන්නේ

(1) ජාත්‍යන්තර මූල්‍ය අරමුදල ය.

(2) ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කරහිමියන් ය.

(3) පැරිස් සමාජයේ සාමාජික රටවල් ය.

(4) ලෝක බැංකුව ය.

(5) ද්විපාර්ශ්වීය ණයහිමියන් ය.

**36.** සහල් සහ රෙදි යන භාණ්ඩ දෙක ම B රටට වඩා කාර්යක්ෂමව A රටට නිෂ්පාදනය කළ හැකි නමුදු B රටට රෙදි නිෂ්පාදනය කිරීමේ දී A රටට වඩා අඩු ආවස්ථික පිරිවැයක් තිබේ නම්, එවිට

(1) A රටට සහල් නිෂ්පාදනය කිරීමේ දී නිරපේක්ෂ වාසියත් සාපේක්ෂ වාසියත් යන දෙක ම ඇත.

(2) B රටට රෙදි නිෂ්පාදනය කිරීමේ දී නිරපේක්ෂ වාසියත් සාපේක්ෂ වාසියත් යන දෙක ම ඇත.

(3) A රට රෙදි නිෂ්පාදනය පිළිබඳ විශේෂ ප්‍රාගුණ්‍යනය කළ යුතු ය.

(4) B රටට වෙළෙඳාමෙන් වාසියක් ලබා ගත නො හැකි ය.

(5) වෙළෙඳාම සඳහා කිසිදු පදනමක් දක්නට නොමැත.

**37.** යම් දෙන ලද වර්ෂයක දී කිසියම් රටක අපනයන මිල දර්ශකය 120ක් ද ආනයන මිල දර්ශකය 150ක් ද අපනයන පරිමා දර්ශකය 110ක් ද විය. එම රටේ ආදායම් වෙළෙඳ අනුපාතිකය වූයේ

(1) 80.0කි. (2) 88.0කි. (3) 132.5කි. (4) 137.5කි. (5) 165.0කි.

**38.** කලාපීය විස්තීර්ණ ආර්ථික හවුල්කාරිත්වයේ (RCEP) සාමාජිකයෙකු **නො වන්නේ** පහත සඳහන් රටවල් අතුරෙන් කුමන රට ද?

(1) චීනය (2) දකුණු කොරියාව (3) ඕස්ට්‍රේලියාව

(4) ඉන්දුනීසියාව (5) ඉන්දියාව



comercehelpofficial

අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාළ ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

CamScanner

**39.** ශ්‍රී ලංකාවේ ගෙවුම් ශේෂයේ ප්‍රාථමික ආදායම් ගිණුමට ඇතුළත් **නො වන්නේ** පහත සඳහන් කවරක් ද?
(1) විදේශිකයන් විසින් හිමි කරගෙන ඇති රජයේ සුරැකුම්පත් සඳහා පොලී ගෙවීම්
(2) විදේශ සෘජු ආයෝජකයන් විසින් ආපසු ගෙන්වා ගන්නා ලාභ
(3) විදේශවල ඇති ශ්‍රී ලාංකික ආයෝජනවලට ලද ලාභාංශ
(4) වසරකට අඩු කාලයක් විදේශයන්හි සේවය කරන ශ්‍රී ලාංකිකයන් විසින් ලබා ගත් වැටුප්
(5) ද්විපාර්ශ්වික හවුල්කරුවන්ගෙන් ලද දිගු කාලීන සහනදායී ණය

**40.** ශ්‍රී ලංකාවේ නිල විදේශ සංචිත ප්‍රධාන වශයෙන් සමන්විත වන්නේ
(1) විදේශ සෘජු ආයෝජන, විශේෂ ගැනුම් හිමිකම් සහ විදේශ ව්‍යවහාර මුදල් තැන්පතුවලිනි.
(2) රත්‍රං, විදේශ මුදල් වත්කම් සහ විශේෂ ගැනුම් හිමිකම්වලිනි.
(3) ස්වෛරීත්ව බැඳුම්කර, විශේෂ ගැනුම් හිමිකම් සහ ප්‍රේෂණවලිනි.
(4) දේශීය බැංකු තැන්පතු, විශේෂ ගැනුම් හිමිකම් සහ රත්‍රං සංචිතවලිනි.
(5) අපනයන ඉපැයීම්, රත්‍රං සහ ආණ්ඩුවේ සුරැකුම්පත්වලිනි.

**41.** රටක් තම වෙළෙඳ හවුල්කරුවන්ට වඩා ඉහළ උද්ධමනයක් අත්විඳින විට බොහෝදුරට විය හැකි ප්‍රතිඵලයක් වන්නේ
(1) දේශීය ව්‍යවහාර මුදල් ඒකකයේ අගය ඉහළ යාම ය.
(2) විනිමය අනුපාතිකයේ සැලකිය යුතු වෙනසක් සිදු නො වීම ය.
(3) දේශීය ව්‍යවහාර මුදල් ඒකකය දිගු කාලීනව ශක්තිමත් වීම ය.
(4) දේශීය ව්‍යවහාර මුදල් ඒකකය ක්ෂය වීම ය.
(5) විදේශ ආයෝජන වැඩි වීම ය.

**42.** විදේශීය ආයෝජකයන් ශ්‍රී ලංකාවෙන් තම කළඹ ආයෝජන ඉවත් කර ගන්නා විට එහි ප්‍රතිඵලයක් වන්නේ
(1) ප්‍රාග්ධන ගිණුමෙහි වාර්තා වන ප්‍රාග්ධන සංක්‍රාම අඩු වීමකි.
(2) ජංගම ගිණුමෙහි වාර්තා වන ශුද්ධ අපනයන වැඩි වීමකි.
(3) මූල්‍ය ගිණුමෙහි වාර්තා වන අරමුදල් පිටතට ගලායාමකි.
(4) සමස්ත ගෙවුම් ශේෂ තත්ත්වයේ උසස් වීමකි.
(5) ප්‍රාථමික ආදායම් ගිණුමෙහි වාර්තා වන පුනි-ආයෝජන ඉපැයීම්වල අඩු වීමකි.

**43.** තිරසාර සංවර්ධනය යන්න වඩාත් හොඳින් විස්තර කළ හැක්කේ
(1) ඕනෑ ම පිරිවැයක් දරමින් වුව ද ආර්ථික වර්ධනයේ දිගු කාලීන වැඩි වීමක් ලෙස ය.
(2) සමාජයේ සෑම සාමාජිකයෙකුගේ ම ජීවන තත්ත්වයේ දිගු කාලීන වැඩි වීමක් ලෙස ය.
(3) ආර්ථිකයේ නිෂ්පාදන විභවතාවයෙහි දිගු කාලීන වැඩි වීමක් ලෙස ය.
(4) පරිසරයට හානියක් නො වන පරිදි ජීවන තත්ත්වයෙහි දිගු කාලීන ඉහළ යාමක් ලෙස ය.
(5) ආර්ථිකයේ සැබෑ නිමැවුමෙහි දිගු කාලීන වැඩි වීමක් ලෙස ය.

**44.** ආර්ථික සංවර්ධනය සහ ආර්ථික වර්ධනය අතර වෙනස වඩාත් හොඳින් පැහැදිලි කරන්නේ පහත සඳහන් කවර ප්‍රකාශයකින් ද?
(1) ආර්ථික වර්ධනය යන්නෙන් අදහස් කරන්නේ ප්‍රතිශීර්ෂ ආදායම ඉහළයාම පමණක් වන අතර, සංවර්ධනයට ආදායම් නො වන පැතිකඩ ද ඇතුළත් වේ.
(2) ආර්ථික සංවර්ධනය දළ දේශීය නිෂ්පාදිතයේ වර්ධනය මගින් මනිනු ලබන අතර, ආර්ථික වර්ධනය මනිනු ලබන්නේ සමාජයීය දර්ශකවල උසස්වීම් මගිනි.
(3) ආර්ථික සංවර්ධනය බහුමාන ක්‍රියාවලියක් වන අතර ආර්ථික වර්ධනය යනු නිමැවුමේ පටු මිනුමකි.
(4) ආර්ථික වර්ධනය ස්වභාවයෙන් ම ගුණාත්මක වන අතර, ආර්ථික සංවර්ධනය ප්‍රමාණාත්මක වේ.
(5) ආර්ථික සංවර්ධනය නිමැවුමේ කෙටි කාලීන වැඩි වීම් කෙරෙහි අවධානය යොමු කරන අතර ආර්ථික වර්ධනය අවධාරණය කරන්නේ දිගු කාලීන ව්‍යුහාත්මක වෙනස්කම් ය.

**45.** මානව සංවර්ධන දර්ශකය තුළ ජීවන තත්ත්වය නිරූපණය කිරීමට භාවිත කරන මිනුම කුමක් ද?
(1) ක්‍රය ශක්ති සාම්‍යය මත ගළපන ලද ප්‍රතිශීර්ෂ දළ දේශීය නිෂ්පාදිතය
(2) ප්‍රතිශීර්ෂ දළ දේශීය නිෂ්පාදිතය
(3) ප්‍රතිශීර්ෂ දළ ජාතික ආදායම
(4) ක්‍රය ශක්ති සාම්‍යය මත ගළපන ලද ප්‍රතිශීර්ෂ දළ ජාතික ආදායම
(5) ස්ථාවර මිල යටතේ ගණනය කරන ලද ප්‍රතිශීර්ෂ දළ දේශීය නිෂ්පාදිතය

[අටවැනි පිටුව බලන්න

commerce.help.official
CamScanner

46. 2023 වර්ෂයේ දී පවත්නා වෙළෙඳපොළ මිල යටතේ ශ්‍රී ලංකාවේ දළ දේශීය නිෂ්පාදිතය සහ ප්‍රතිශීර්ෂ දළ ජාතික ආදායම වූයේ

| | දළ දේශීය නිෂ්පාදිතය (අමෙරිකානු ඩොලර් බිලියන) | ප්‍රතිශීර්ෂ දළ ජාතික ආදායම (අමෙරිකානු ඩොලර්) |
|---|---|---|
| (1) | 96.5 | 4 516 |
| (2) | 96.5 | 3 685 |
| (3) | 83.8 | 3 801 |
| (4) | 83.8 | 3 685 |
| (5) | 76.8 | 3 379 |

47. අස්වැසුම ප්‍රතිලාභීන් හඳුනාගැනීමේ දී භාවිත කරන ප්‍රධාන රාමුව වන්නේ
   (1) කුටුම්බ ආදායම් සීමාව පමණි.
   (2) බහුමාන දරිද්‍රතා ප්‍රවේශය යි.
   (3) ගෘහ ඒකකයේ මාසික විදුලි බිලයි.
   (4) දිස්ත්‍රික්කය අනුව භූගෝලීය ඉලක්කකරණය යි.
   (5) ගෘහ ඒකක පදනම් කරගත් අහඹු නියැදුම් ක්‍රමය යි.

48. A රටෙහි ලෝරන්ස් වක්‍රය මුළුමනින් ම B රටෙහි ලෝරන්ස් වක්‍රයට වඩා පහළින් පිහිටා තිබේ නම් එයින් ගම්‍ය වන්නේ
   (1) A රටෙහි B රටට වඩා වැඩි ආදායම් අසමානතාවක් ඇති බව ය.
   (2) B රටෙහි A රටට වඩා වැඩි ආදායම් අසමානතාවක් ඇති බව ය.
   (3) රටවල් දෙකට ම එක හා සමාන වූ ආදායම් ව්‍යාප්තියක් ඇති බව ය.
   (4) A රටට B රටට වඩා වැඩි ඒක පුද්ගල දළ දේශීය නිෂ්පාදිතයක් ඇති බව ය.
   (5) B රටෙහි නිරපේක්ෂ දරිද්‍රතාව A රටට වඩා වැඩි බව ය.

49. බ්‍රික්ස් (BRICS) සංවිධානය තුළ වර්තමානයේ දක්නට ලැබෙන ප්‍රධාන ප්‍රවණතාවක් වන්නේ
   (1) මිලිටරි සන්ධානයක් ලෙස ක්‍රියා කිරීමට එය දරන උත්සාහය යි.
   (2) බටහිර ආධිපත්‍යය දරන මූල්‍ය පද්ධති වෙනුවට විකල්ප ස්ථාපිත කිරීමට එය දරන උත්සාහය යි.
   (3) සියලු ම බ්‍රික්ස් මුදල් වර්ග චීන යුවාන් සමග ඈඳීමට (pegging) දරන උත්සාහය යි.
   (4) ගෝලීය වශයෙන් පොසිල ඉන්ධන භාවිතය තුරන් කිරීමට දරන උත්සාහය යි.
   (5) බ්‍රික්ස් සාමාජික රටවල් අතර පමණක් වෙළෙඳාම සීමා කිරීමට දරන උත්සාහය යි.

50. ශ්‍රී ලංකාව 1977 දී හඳුන්වා දුන් ප්‍රධාන ආර්ථික ප්‍රතිසංස්කරණය සනිටුහන් කරනු ලැබූයේ
   (1) ආනයන ආදේශන උපාය මාර්ගයක සිට අපනයන නැඹුරු වෘද්ධි උපාය මාර්ගයකට මාරුවීමකි.
   (2) වෙළෙඳපොළ ලිබරල්වාදයේ සිට වෙළෙඳපොළ ආරක්ෂණවාදයට මාරුවීමකි.
   (3) අපනයන අභිමුඛ වර්ධනයක සිට ආනයන ආදේශනයට මාරුවීමකි.
   (4) නිෂ්පාදන ආර්ථිකයක සිට සේවා නැඹුරු ආර්ථිකයක් කරා මාරුවීමකි.
   (5) විවෘත වෙළෙඳපොළ ආර්ථිකයක සිට සංවෘත සමාජවාදී ආර්ථිකයක් කරා මාරුවීමකි.

* * *

comerce help official

අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න
CamScanner

සියලු ම හිමිකම් ඇවිරිණි /முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved]

**ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව**
**இலங்கைப் பரீட்சைத் திணைக்களம்**
**Department of Examinations, Sri Lanka**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2025
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2025
General Certificate of Education (Adv. Level) Examination, 2025

| | | |
|---|---|---|
| **ආර්ථික විද්‍යාව** | **II** | |
| பொருளியல் | **II** | **21 S II** |
| Economics | **II** | |

**පැය තුනයි**
*மூன்று மணித்தியாலம்*
*Three hours*

| | | |
|---|---|---|
| **අමතර කියවීම් කාලය** | - | **මිනිත්තු 10 යි** |
| மேலதிக வாசிப்பு நேரம் | - | 10 நிமிடங்கள் |
| Additional Reading Time | - | 10 minutes |

**අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.**

**උපදෙස් :**

- ✻ 'අ' උප කොටසෙන් අවම වශයෙන් ප්‍රශ්න **දෙකක්** ද, 'ආ' උප කොටසෙන් අවම වශයෙන් ප්‍රශ්න **දෙකක්** ද තෝරාගෙන, ප්‍රශ්න **පහකට** පමණක් පිළිතුරු සපයන්න.
- ✻ ප්‍රස්තාර කඩදාසි සපයනු ලැබේ.

## 'අ' උප කොටස

(මෙම කොටසෙන් අවම වශයෙන් ප්‍රශ්න **දෙකක්** තෝරා ගන්න.)

1. (i) දේපළ සම්පත් සහ මානව සම්පත් නිර්වචනය කර ඒවාට **එක්** උදාහරණය බැගින් දෙන්න. (ලකුණු 04යි)

   (ii) හිඟකම හේතුවෙන් ආවස්ථික පිරිවැය පැනනගිනුයේ කෙසේ ද? පුද්ගලයන් හා රජයන් මුහුණ දෙන ආවස්ථික පිරිවැය සඳහා උදාහරණ සපයන්න. (ලකුණු 04යි)

   (iii) නූතන නිෂ්පාදන පද්ධති තුළ ඵලදායිතාව ඉහළ නැංවීම සඳහා ශ්‍රම විභාජනය දායක වන්නේ කෙසේ දැයි කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 03යි)

   (iv) වෙළෙඳපොළ ආර්ථික පද්ධති සහ විධාන ආර්ථික පද්ධති අතර ආර්ථික නිදහස හා පාරිභෝගික ස්වාධිපත්‍යය වෙනස් වන්නේ කෙසේ දැ'යි පැහැදිලි කරන්න. (ලකුණු 04යි)

   (v) වෙළෙඳපොළ ආර්ථික පද්ධතියක මූලික ආර්ථික ප්‍රශ්න විසඳීමේ දී මිල යාන්ත්‍රණයේ කාර්යක්ෂමතාව අගයන්න. (ලකුණු 05යි)

2. (i) සැපයුම් වක්‍රය විතැන් වීමකට හේතු විය හැකි සාධක **තුනක්** ලැයිස්තු ගත කරන්න. (ලකුණු 03යි)

   (ii) ඉල්ලුමේ මිල නම්‍යතාව යනුවෙන් අදහස් කරනුයේ කුමක් ද? එය මුළු අයභාරයට බලපානුයේ කෙසේ දැ'යි පහදන්න. (ලකුණු 04යි)

   (iii) යෝග්‍ය රූපසටහන් භාවිත කරමින් ආදායමේ වෙනස් වීමක් සාමාන්‍ය හා බාල භාණ්ඩ සඳහා ඇති ඉල්ලුමට බලපාන ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 04යි)

   (iv) නිෂ්පාදක අතිරික්තය නිර්වචනය කර සැපයුම හා ඉල්ලුම සහිත රූපසටහනක එය නිරූපණය කරන ආකාරය පෙන්නුම් කරන්න. (ලකුණු 04යි)

   (v) නිෂ්පාදන තාක්ෂණයේ වැඩි දියුණුවීමක් වෙළෙඳපොළ සමතුලිතතාවයේ වෙනස්කම් හටගැනීමට හේතු විය හැක්කේ කෙසේ ද? ඔබේ පිළිතුර සඳහා රූපසටහන් ආධාර කර ගන්න. (ලකුණු 05යි)

3. (i) අවම මිලක් යනු කුමක් ද? තරඟකාරී ශ්‍රම වෙළෙඳපොළක් තුළ සමතුලිත වැටුපට වඩා ඉහළින් අවම වැටුපක් පැනවීමෙන් හැඟැවෙන දෑ රූපසටහනක් යොදා ගනිමින් පෙන්නුම් කරන්න. (ලකුණු 04යි)

   (ii) කෘෂිකාර්මික භාණ්ඩ මිල ස්ථායිකරණය සඳහා රජයේ ස්වාරක්ෂක තොග පවත්වා ගෙන යාමේ සඵලතාව අගයන්න. එවැනි යෝජනා ක්‍රම අසාර්ථක වීමට හේතු විය හැකි සාධක මොනවා ද? (ලකුණු 04යි)

[දෙවැනි පිටුව බලන්න

(iii) කෘෂිකාර්මික භාණ්ඩයක වෙළෙඳපොළ ඉල්ලුම් ($Q_D$) සහ සැපයුම් ($Q_S$) ශ්‍රිත පහත සමීකරණ මගින් ලබා දී ඇත. මෙම සමීකරණවල P යනු කිලෝග්‍රෑමයක මිල රුපියල්වලින් ද Q යනු ප්‍රමාණය මෙට්‍රික් ටොන්වලින් ද වේ.

$Q_D = 720 - 4P$ $\qquad\qquad$ $Q_S = -180 + 6P$

(අ) වෙළෙඳපොළ සමතුලිත මිල සහ සමතුලිත ප්‍රමාණය ගණනය කරන්න. (ලකුණු 02යි)

(ආ) ගොවීන්ට කිලෝග්‍රෑමයකට රු. 100ක් ලැබෙන බවට සහතිකයක් සහිත ව රජය දැන් ඌනපූර්ණ ගෙවීම් ක්‍රමයක් හඳුන්වා දෙනැයි සිතමු. එම මිල ආධාරක වැඩ සටහනින් පසුව මෙම භාණ්ඩය වෙළෙඳපොළ තුළ අලෙවි වන මිල ගණනය කරන්න. (ලකුණු 03යි)

(ඇ) මිල ආධාරක වැඩසටහන සඳහා රජයට දැරීමට සිදුවන පිරිවැය ඇස්තමේන්තු කරන්න. (ලකුණු 03යි)


(ඈ) මිල ආධාරක වැඩසටහනට පෙර හා පසු නිෂ්පාදක අතිරික්තය සසඳන්න. (ලකුණු 04යි)

4. (i) කෙටි කාලීන නිෂ්පාදන ශ්‍රිතය නිර්වචනය කර, එය දිගු කාලීන නිෂ්පාදන ශ්‍රිතයෙන් වෙනස් වන ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 03යි)

(ii) කෙටි කාලීන නිෂ්පාදන ශ්‍රිතය මගින් ආයතනයක සාමාන්‍ය විචල්‍ය පිරිවැය (AVC) සහ ආන්තික පිරිවැය (MC) වක්‍රවල හැඩය හා හැසිරීම පැහැදිලි කරන්නේ කෙසේ ද? (ලකුණු 04යි)

(iii) ආයතනයේ පිරිවැය ව්‍යුහයේ කොටසක් ලෙස ප්‍රාමාණික ලාභය ඇතුළත් කිරීම ඔබ සාධාරණීයකරණය කරන්නේ කෙසේ ද? (ලකුණු 04යි)

(iv) පහත රූපසටහන පූර්ණ තරගකාරී ආයතනයක කෙටි කාලීන පිරිවැය ව්‍යුහය සහ පැවතිය හැකි වෙළෙඳපොළ මිල ගණන් පෙන්වයි.




වෙළෙඳපොළ මිල කිලෝග්‍රෑමයකට රු. 45ක් නම්,

(අ) ආර්ථික ලාභය හෝ අලාභය ගණනය කරන්න. (ලකුණු 02යි)

(ආ) ආයතනයේ මුළු ස්ථාවර පිරිවැය ගණනය කරන්න. (ලකුණු 02යි)

(v) ඒකාධිකාරී තරගය නිර්වචනය කර එය පූර්ණ තරගයෙන් හා ඒකාධිකාරයෙන් වෙනස්වන ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 05යි)

5. (i) එකතු කළ වටිනාකම් ක්‍රමය භාවිත කරමින්, ජාතික ගිණුම් සැකසීමේ දී රාජ්‍ය සේවයේ නිමැවුමේ වටිනාකම ඇස්තමේන්තු කරන ආකාරය විස්තර කරන්න. (ලකුණු 04යි)

(ii) කල්පිත ආර්ථිකයක ජාතික ගිණුම්වලට අදාළ දත්ත කිහිපයක් පහත වගුවෙහි දක්වා ඇත.

| අයිතමය | වටිනාකම (රුපියල් මිලියන) |
|---|---|
| කෘෂිකර්මය, වන වගාව සහ ධීවර අංශයේ දළ එකතු කළ අගය | 1 500 |
| කර්මාන්ත අංශයේ දළ එකතු කළ අගය | 4 500 |
| සේවා අංශයේ දළ එකතු කළ අගය | 9 500 |
| පෞද්ගලික පරිභෝජන වියදම | 12 000 |
| රජයේ පරිභෝජන වියදම | 1 500 |
| දළ දේශීය ප්‍රාග්ධන සම්පාදනය | 4 500 |
| භාණ්ඩ හා සේවා අපනයන | 2 000 |
| භාණ්ඩ හා සේවා ආනයන | 3 000 |
| නිෂ්පාදිත මත සහනාධාර අඩු කළ බදු | 1 500 |

[තුන්වැනි පිටුව බලන්න

PAST PAPERS WIKI

අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

Past Papers Wiki



වගුවේ දී ඇති දත්ත භාවිත කරමින් පහත සඳහන් දෑ ගණනය කරන්න.

(අ) මූලික මිල යටතේ නිමැවුමේ දළ වටිනාකම (ලකුණු 02යි)

(ආ) දළ දේශීය නිෂ්පාදිතය (ලකුණු 02යි)

(ඉ) දළ දේශීය ඉතුරුම් (ලකුණු 02යි)

(iii) කල්පිත ආර්ථිකයක ආන්තික ඉතුරුම් නැඹියාව (MPS) 0.2ක් වේ යැයි සිතමු. මෙම ආර්ථිකයේ සංක්‍රාම ගුණකයේ අගය ගණනය කර, රජයේ සංක්‍රාම වියදම් රුපියල් මිලියන 100 කින් වැඩි කිරීම නිසා ජාතික ආදායමේ මුළු වැඩි වීම ගණනය කරන්න. (ලකුණු 04යි)

(iv) රජයේ කටයුතු නොමැති සංවෘත ආර්ථිකයක සමාහාර පරිභෝජන ශ්‍රිතය $C = 200 + 0.8Y$ සහ ආයෝජනය $I = 80$ වශයෙන් ලබා දී ඇතැයි සිතමු. (වටිනාකම් රුපියල් බිලියනවලිනි.)

(අ) මෙම ආර්ථිකයේ සමතුලිත ජාතික ආදායම් මට්ටම ගණනය කරන්න. (ලකුණු 02යි)

(ආ) සමතුලිත ජාතික ආදායම් මට්ටම තීරණය වන ආකාරය පෙන්නුම් කිරීමට රූපසටහනක් අඳින්න. (ලකුණු 04යි)

## 'ආ' උප කොටස

(මෙම කොටසෙන් අවම වශයෙන් ප්‍රශ්න **දෙකක්** තෝරා ගන්න.)

**6.** (i) මුදලේ අභ්‍යන්තර වටිනාකම නිර්වචනය කර එය ආර්ථිකයක් තුළ පොදු මිල මට්ටම හා සම්බන්ධ වන්නේ කෙසේ දැ'යි සඳහන් කරන්න. (ලකුණු 03යි)

(ii) මුදල් ප්‍රමාණවාදී න්‍යාය ව්‍යුත්පන්න කිරීමට විනිමය සමීකරණය භාවිත කිරීමේ දී යොදා ගැනෙන උපකල්පන දක්වන්න. නූතන ආර්ථිකයන්හි මෙම උපකල්පන කෙතරම් යථාර්ථවාදී දැ'යි පරීක්ෂා කරන්න. (ලකුණු 04යි)

(iii) කල්පිත වාණිජ බැංකුවක සරල කරන ලද ශේෂ පත්‍රයක් පහත දක්වා ඇත.

| වගකීම් (රු.) | | වත්කම් (රු.) | |
|---|---|---|---|
| ඉල්ලුම් තැන්පතු | 200 000 | අවශ්‍ය සංචිත | 10 000 |
| ප්‍රාග්ධනය | 120 000 | අධි සංචිත | 4 000 |
| | | ණය | 180 000 |
| | | සුරැකුම්පත් | 50 000 |
| | | ගොඩනැගිලි | 76 000 |
| එකතුව | 320 000 | එකතුව | 320 000 |

(අ) අවශ්‍ය සංචිත අනුපාතය ගණනය කරන්න. (ලකුණු 02යි)

(ආ) ගනුදෙනුකරුවෙක් බැංකුවෙහි ඇති තම ජංගම ගිණුමෙන් රු. 20 000ක මුදලක් ආපසු ගන්නා බව උපකල්පනය කරන්න. මෙම මුදල් ආපසු ගැනීම නිසා බැංකුවේ අවශ්‍ය සංචිත කොපමණ ප්‍රමාණයකින් වෙනස් වේ ද? (ලකුණු 02යි)

(ඉ) මෙහි දී බැංකුව කිසිදු ණයක් ආපසු කැඳවනු නො ලැබේ යැ'යි උපකල්පනය කළහොත්, ඉහත දක්වන ලද මුදල් ඉවතට ගැනීම සිදුවන අවස්ථාවේදී ම අවශ්‍ය සංචිත අනුපාතය පවත්වා ගැනීමට බැංකුවට ගත හැකි විකල්ප ක්‍රියාමාර්ග කවරේ ද? (ලකුණු 02යි)

(iv) 2023 නව මහ බැංකු පනතේ දක්වා ඇති පරිදි ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රධාන අරමුණ දක්වන්න. (ලකුණු 02යි)

(v) මහ බැංකු පනතේ හඳුන්වා දී ඇති නව මූල්‍ය ප්‍රතිපත්ති රාමුව විස්තර කරන්න. එය ඊට පෙර පැවති ප්‍රතිපත්ති රාමුවෙන් වෙනස් වන්නේ කෙසේ දැ'යි පැහැදිලි කරන්න. (ලකුණු 05යි)

7. (i) නිෂ්පාදනයේ සෘණ බාහිරතා නිර්වචනය කර එය වෙළෙඳපොළ අසාර්ථකත්වයට හේතු වන ආකාරය රූපසටහනක් ඇසුරෙන් පැහැදිලි කරන්න. (ලකුණු 04යි)

(ii) රජයේ පුනරාවර්තන වියදම් යන්නෙන් අදහස් කරන්නේ කුමක් ද? ශ්‍රී ලංකා රජයේ අයවැය ලේඛනයෙහි පුනරාවර්තන වියදමෙහි ප්‍රධාන සංරචක **තුන** දක්වන්න. (ලකුණු 04යි)

(iii) ශ්‍රී ලංකාවේ ලාභ ලබන ප්‍රධාන රාජ්‍ය ව්‍යවසාය **තුනක්** නම් කරන්න. (ලකුණු 03යි)

(iv) 2022 වර්ෂයේ ආර්ථික අර්බුදයෙන් පසුව ශ්‍රී ලංකාව හඳුන්වා දුන් ප්‍රධාන බදු ප්‍රතිසංස්කරණ සඳහන් කරන්න. (ලකුණු 04යි)

(v) රාජ්‍ය පෞද්ගලික හවුල්කාරිත්වයන් (PPPs) නිර්වචනය කර ශ්‍රී ලංකා රජයේ අයවැය හිඟය අඩු කිරීමට සහ රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතාව සාක්ෂාත් කර ගැනීමට රාජ්‍ය පෞද්ගලික හවුල්කාරිත්වයන් දායක වන ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 05යි)

8. (i) සාපේක්ෂ වාසිය සහ තරගකාරිත්ව වාසිය අතර මූලික වෙනස උදාහරණ සමග පැහැදිලි කරන්න. (ලකුණු 04යි)

(ii) ද්විත්ව-සටහන් මූලධර්මයට අනුව පහත සඳහන් ජාත්‍යන්තර ගනුදෙනුවල බැර සහ හර සටහන් ශ්‍රී ලංකාවේ ගෙවුම් ශේෂ ගිණුමේ වාර්තා කරනු ලබන්නේ කෙසේ ද?

(අ) ශ්‍රී ලාංකික නේවාසිකයෙකුට විදේශයකින් ඩොලර් 500ක ප්‍රේෂණයක් ලැබීම

(ආ) ශ්‍රී ලාංකික කෘෂි රසායන සමාගමක් විසින් විශේෂිත කෘෂි රසායනයක් දේශීය වශයෙන් නිපදවීම සඳහා ඩොලර් මිලියන 50ක් ගෙවා ස්වාධිකාර (patent) බලපත්‍රයක් මිලට ගැනීම

(ඉ) ශ්‍රී ලංකා රජය නිව්යෝර්ක් මුදල් වෙළෙඳපොළෙහි සංවර්ධන බැඳුම්කර අලෙවි කොට ඩොලර් මිලියන 200ක ණය මුදලක් ලබා ගැනීම (ලකුණු 03යි)

(iii) ශ්‍රී ලංකාවේ විදේශ විනිමය අනුපාතිකය තීරණය කරන ප්‍රධාන ඉල්ලුම් හා සැපයුම් සාධක කවරේ ද? (ලකුණු 04යි)

(iv) සෘජු විදේශ ආයෝජන යන්නෙන් අදහස් වන්නේ කුමක් ද? ශ්‍රී ලංකාවට සෘජු විදේශ ආයෝජන ආකර්ෂණය කරගැනීමෙහි ලා අනුගමනය කළ හැකි උපායමාර්ග **තුනක්** සඳහන් කරන්න. (ලකුණු 04යි)

(v) ශ්‍රී ලාංකික අපනයන සඳහා එක්සත් ජනපද තීරුබදු වෙනස්වීම් ශ්‍රී ලංකාවේ ගෙවුම් ශේෂයට හා විදේශ විනිමය ඉපැයීම්වලට බලපාන්නේ කෙසේ දැයි පරීක්ෂා කරන්න. (ලකුණු 05යි)

9. (i) තිරසාර සංවර්ධනයේ ප්‍රධාන කුළුණු **තුන** නම්කර ඒවා එකිනෙක අතර ඇති අන්තර් සම්බන්ධතා පැහැදිලි කරන්න. (ලකුණු 04යි)

(ii) හුදෙක් දළ දේශීය නිෂ්පාදිතයේ වර්ධනයෙන් පමණක් පිළිබිඹු කළ නො හැකි සංවර්ධනයේ විවිධ පැතිකඩ මානව සංවර්ධන දර්ශකය විසින් ග්‍රහණය කරගන්නේ කෙසේදැයි පැහැදිලි කරන්න. (ලකුණු 05යි)

(iii) (අ) ශ්‍රම බලකා සහභාගිත්ව අනුපාතිකය නිර්වචනය කරන්න. (ලකුණු 02යි)

(ආ) ශ්‍රී ලංකාවේ කාන්තා ශ්‍රම බලකා සහභාගිත්ව අනුපාතිකය පහළ මට්ටමක පැවතීමට දායක වන ප්‍රධාන සාධක **තුනක්** සඳහන් කරන්න. (ලකුණු 03යි)

(iv) (අ) නිරපේක්ෂ දරිද්‍රතාව නිර්වචනය කරන්න. (ලකුණු 02යි)

(ආ) ජාතික හා ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුව ශ්‍රී ලංකාවේ නිරපේක්ෂ දරිද්‍රතාව මනිනු ලබන්නේ කෙසේ දැයි පැහැදිලි කරන්න. (ලකුණු 04යි)

10. (i) 2022 වර්ෂයේ ශ්‍රී ලංකාවේ ආර්ථික අර්බුදයට දායක වූ ප්‍රධාන ප්‍රතිපත්තිමය අසමත්වීම් කවරේ දැ'යි පැහැදිලි කරන්න. (ලකුණු 05යි)

(ii) ශ්‍රී ලංකාවේ ආර්ථික වෘද්ධිය වේගවත් කර තිරසාර ලෙස පවත්වා ගැනීම සඳහා කඩිනමින් අවශ්‍ය කරන ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණ සිදුකළ යුතු ප්‍රධාන ක්ෂේත්‍ර **පහක්** සඳහන් කරන්න. (ලකුණු 05යි)

(iii) ඉහළ එකතු කළ අගයක් ලබා දෙන නිෂ්පාදන හා සේවා අංශ සංවර්ධනයට සහායවීම සඳහා ශ්‍රී ලංකාව අනුගමනය කළ යුතු වැදගත් කාර්මික ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග මොනවා ද? (ලකුණු 05යි)

(iv) ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ විස්තීර්ණ ණය පහසුකම් වැඩසටහන යටතේ ශ්‍රී ලංකාවේ සාර්ව ආර්ථික කාර්යසාධනය වැඩි දියුණු වී ඇත්තේ කෙසේ ද? එහි ලා තවදුරටත් පවතින ප්‍රධාන අභියෝග කවරේ දැයි පැහැදිලි කරන්න. (ලකුණු 05යි)

* * *

අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න